# නූතන සිංහල කවීනට අභ්‍යාස අඩවියක් වශයෙන් සයිබර් අවකාශීය ප්‍රකාශනයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

ආර්. ඩී. උමේෂා මධුමාලි, භාෂා අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.
umabelihuloya@gmail.com

**සංක්ෂිප්තය**

සිය වස් ගණනක් තිස්සේ ප්‍රදේශීය වශයෙන් ද යුග වකවානු වශයෙන් ද ආකෘතික වශයෙන ්ද දේශපාලනකි, සමාජීය, සංස්කෘතික සහ ආර්ථික සට්ටන හමුවේ සංවර්ධනය වෙමින් ද අවවර්ධනය වෙමින් ද 'මහා කාව්‍ය සම්ප්‍රදායයක්' සිංහල 'කවිය' පදනම් කොටගෙන බිහි වී ඇත. ඒ මුද්‍රිත ප්‍රකාශන මාධ්‍ය වන පුවත් පත්, ග්‍රන්ථ සහ සඟරා ආදිය මූලික කරගෙන යි. පරිගණක යන්ත්‍ර එකිනෙක ජාලගත කිරීමේ අරමුණ ඇති ව ටිම් බර්නස් ලී විසින් විශ්ව විසිරි වියමන (1989) ලෝකයට හඳුන්වාදෙනු ලැබීමත් සමඟ අන්තර්ජාලය බිහි විය. ශ්‍රී ලංකාව අන්තර්ජාලය හා සම්බන්ධ වන්නේ 1995 වසරේ දී ය. මේ සමඟ ලාංකේය නතූන කවියට නව ප්‍රකාශන මාධ්‍යයක් ලැබිණි. ශලිා ලේඛන මාධ්‍ය, පුස්කොළ, කවි මඩු, කවි පොත්, කවි කොළ වැනි මාධ්‍ය පසු කරමින් ආ නතූන කවිය සයිබර් අවකාශය වෙත ප්‍රවිෂ්ට වී ඇති අතර ඒ කවි 'සයිබර් කවි' ලෙස හැඳින්වේ. ප්‍රකාශනයේ දියුණුව සමඟ බිහි වූ මේ 'සයිබර් අවකාශගත කවිය' දශක දෙකක පමණ කාලයක සිට සමාජ ජාල වෙබ් අඩවි (ෆේස්බුක්, ට්විටර්), බ්ලොග් අඩවි (බ්ලූන්දි) ඔස්සේ දිගහැරේ. සසීම සමාජ කණ්ඩායමක් අතර සීමා වෙමින ්තුබූ සිංහල කවිය නූතන තාක්ෂණය හේතුවෙන් පුළුල් ලෙස සමාජයට විවර වී ඇත. මේ හේතුවෙන් ඕනෑ ම පුද්ගලයකුට ක්ෂණයකින් කවියක් සයිබර් අවකාශය ඔස්සේ පාඨක සමාජයට ඉදිරි පත් කළ හැකි ය. එබැවින් ආධුනික කවීනට සයිබර් අවකාශය අභ්‍යාස අවධියකි. මීට පෙර ආධුනික කවීනට තුබූ අභ්‍යාස අඩවිය වන්නේ පුවත්පත් හා සඟරා මාධ්‍ය යි. ඒ සඳහා සුදුසුකම් ලබන්නේ සසීම පිරිසකි. එනමුත් සයිබර් අවකාශය එසේ නොවේ. ක්ෂණික ව බාධාවකින් තොර ව ප්‍රකාශනය පළ කළ හැකි වීමත් ඕනෑ ම පුද්ගලයකුට විවෘත විමත් සයිබර් අවකාශීය මාධ්‍ය මෙවලමේ ඇති මූලික ලක්ෂණය යි. මේ අනවු නවක කවීනට අභ්‍යාස අඩවියක් වශයෙන් සයිබර් අවකාශයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යනය කිරීම මේ පර්යේෂණයේ අරමුණ යි. වර්තමායේ අනත්ර්ජාලය වටා එක් වූ පාඨක පිරිසක් ද ඒ වටා බිහි වූ සංවාද අවකාශයක් ද ගොඩනැගෙමින් පවතී. මෙසේ ගොඩනැඟී එන කවිය ඔස්සේ මේ වන විට සම්මාන ප්‍රදානෝත්සව ද (නෙළුම් යාය බ්ලොග සම්මාන උලෙළ 2014 ආදි) සංවිධානය වේ. සයිබර් අවකාශගත කවිය පිළිබඳ කෙරුණු විධිමත් ශාස්ත්‍රීය අධ්‍යනයක් මේ වන තුරුත් විද්‍යමාන නොවේ. ඒ පිළිබඳ ඇති යම් අධ්‍යයන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල අල්ප වශයෙන් දැකිය හැකි ය. සමාජ ජාල වෙබ් අඩවි සහ බ්ලොග් අඩවි ඔස්සේ බිහි වන සඳැස්, නිසඳැස් කවි මේ අධ්‍යයනය සඳහා භාවිතයට ගැනිණි. තෝරාගත් නර්මාණකරුවනග්ෙ කවි ආශ්‍රයෙන් සයිබර් අවකාශගත කවියේ අනහුූතීන්, ජීවන දෘෂ්ටින්, භාවිත භාෂාව, නිර්මාණකරුවන්ගේ සමාජ දැක්ම, ආකෘතිය ආදිය පිළිබඳ අධ්‍යනය කෙරිණි.

**ප්‍රමුඛ පද :** සයිබර් කවිය, ආධුනික කවීන්, අභ්‍යාස අඩවිය, සයිබර් අවකාශය

## හැඳින්වීම

සිංහල කවියේ ගමන් මඟ ඒ ඒ රාජධානි යුග වශයෙන් වර්ධනය වෙමින් ද, අවවර්ධනය වෙමින් ද විකාශය විය. අනුරාධපුර යුගයෙන් ඇරඹි කවිය, මාතර යුගය දක්වා ද එතැනින් කොළඹ යුගයට ද එළඹිණි. ඉන් පසු අවධිය නිසඳැස් කවි යුගය යි. මෙලෙස වර්ධනය වූ කවියේ නතූන ප්‍රවණතාව ලෙස සයිබර් අවකාශීය කවිය හැඳින්විය හැකි ය. සයිබර් අවකාශයී ප්‍රකාශන මාධ්‍ය වන බ්ලොග් අඩවි, වෙබ් අඩවි, ෆේස්බුක්හි දිග හැරෙන කවි මෙනයින් හැඳින්වේ. මෙලෙස සයිබර් අවකාශයී ප්‍රකාශන මාධ්‍ය බහුල ලෙස යොදාගන්නේ නව තරුණ කවි පරපුර යි. එබැවින් සයිබර් අවකාශය අභ්‍යාසලාභී නව කවි කිවිඳියනට වැඩ බිමක් බවට පත් ව ඇත. මින් පෙර එකී කාර්යය පුවත්පත්, සඟරා කවි පිටු මඟින් සිදු විය. (වර්තමානයේ දීත් එය සිදු වේ.) 80, 90 දශකයනහී යොවුන් පහන් වැට, පද්ම තටාකය, කව්මුතු ඊට නිදසුන් ය. 2000 දශකයෙන් පසු ව ද නව කවීහු රාවය "මකරන්ද", තඹරවිල, වීමංසා, වටමඬල, සඳකඩ පහන, සරසවි උයන ආදි සාහත්‍ය අතිරේක ද අභ්‍යාස අඩවියක් කරගත්තෝ වෙති. සිව්දෙස, දෙසතිය, පෙරමඟ, කල්පනා, නවයුගය, මාතොට, මනහර, මුතුහර ආදි සඟරා ද ආධුනික කවීනට අභ්‍යාස ක්ෂෙත්‍රයක් විය. මෙහි පළ වූ කවි පොතකට සංග්‍රහ වීම පසු ව සිදු වූ අතර මහින්ද කුමාර දළුපොත, පියංකාරගේ බන්දුල ජයවීර, චූලානන්ද සමරනායක ආදි කවීහු එලෙස බිහි වූ කවීන්ගෙන් කිහිප දෙනෙකි. මේ අයුරින් එකල නව කවීන්ගේ වැඩබිම පුවත්පත, සඟරාව වූවා සේ මෙකල නව කවියාගේ වැඩ බිම අන්තර්ජාලය බවට පත් ව ඇත. ඒ ඔස්සේ නව කවියෝ බිහි වෙති. ඒ අනුව නතූන සිංහල නව කවීනට අභ්‍යාස අඩවියක් වශයෙන් සයිබර් අවකාශීය ප්‍රකාශනයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යනය කිරීම මේ පර්යේෂණයේ මලූික අරමුණ වේ. එමෙන් ම සයිබර් අවකාශයී කවිය පිළිබඳ සාහත්‍ය මූලාශ්‍ර විරල බැවින් එහි පර්යේෂණ සංචිතය දියුණු කිරිම ද මෙහි තවත් එක් අරමුණකි.

## පර්යේෂණ ක්‍රමවේදය

සයිබර් අවකාශගත කවිය පිළබිඳ මේ වන තුරුත් ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු වී නොමැත. එබැවින් සයිබර්ගත කවිය පිළබිඳ ඇති සාහත්‍ය මූලාශ්‍ර ඉතා අල්ප ය. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය අවකාශයන්හි යම් පමණින් සංවාද හා මතවාද ඉදිරි පත් වී ඇති අතර පුවත් පත්, සඟරා (ප්‍රලේඛා, ලංකාර), වෙබ් අඩවි, බ්ලොග් අඩවි ඊට උදාහරණ කිහිපයකි. එක් දහස් නවසිය අනූව දශකයේ අග භාගයෙන් පසු ලංකාවේ සයිබර් කවිය පිළිබඳ රචිත සසීම ලිපි ලේඛන ප්‍රමාණය ද්විතියික දත්ත වශයෙන් මේ සඳහා මූලාශ්‍ර කරගැනිණි (සෙනෙවිඃ 2011, ගලප්පත්තිඃ 2014). සයිබර් අවකාශයේ නව කවි කිවිඳියන් හා සයිබර් අවකාශයේ පාඨකයන් සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡා ඇසුරින් සයිබර් කවිය පිළිබඳ දක්වන අදහස් ද මෙහි දී විමසීමකට ලක් කෙරේ. එහි දී සඳුන් ප්‍රියංකර විතානගේ, ඉන්දික ගුණවර්ධන, සුපුන් අතුකෝරලවැනි සයිබර් කවීන් සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී කරගැනේ. මේ වන විට ක්‍රියාත්මක වන බ්ලොග් සම්මාන උලෙළවල (නෙළුම් යාය බ්ලොග සම්මාන උළෙල 2014) දී පැවැත්වූ දේශන, ග්‍රන්ථ එළි දැක්වීම් උලෙළවල දී පැවැත්වූ දේශන, සහ පාඨක අදහස් ද මූලාශ්‍ර ලෙස භාවිතයට ගැනේ. මේ පිළිබඳ ව කෙරුණු සාහිත්‍ය මූලාශ්‍රය විරල බැවින් සයිබර් කවි අධ්‍යයනය කිරීම ද මෙහි දී සිදු කෙරිණි. ඒ අනවු ලිඛිත මූලාශ්‍රය, සම්මුඛ සාකච්ඡා හා ස්වයං අධ්‍යයන පදනම් ව මේ අධ්‍යයනය සිදු කෙරේ.

## ප්‍රතිඵල විශ්ලේෂණය

සයිබර් අවකාශගත කවිය ෆේස්බුක් කවි හා බ්ලොග් කවි ලෙස වර්ග කළ හැකි ය. මේ අතරින් කවිය සම්බන්ධයෙන් සයිබරයේ විශාල අවකාශයක් ෆේස්බුක් ලබාගෙන සිටියි. එබැවින් හැම පුද්ගලයකුට ම ෆේස්බුක් ගිණුමකින් සයිබර් අවකාශයට කවි ඉදිරි පත් කළ හැකි ය. කවිය පළ කරන මාධ්‍ය අතරින් සයිබර් අවකාශය ශීඝ්‍රගාමී ප්‍රතිඵල ගෙන දෙන මාධ්‍ය මෙවලමකි (වෙඩිවර්ධන 4 කලාපයඃ7). සයිබර් අවකාශයේ කවීන් සහ කිවිඳියන් කිහිප දෙනකු ලෙසට රුවන් බන්දුජීව, සමිත බී. අටුවබැන්දල, රුවන් නෙලූ, රුවන් නන්දික, රුවන් වීරතුංග, කපිල එම් ගමගේ, ධනඥ්කා නිෂාදි කුලරත්න, ප්‍රසාද් වීරසිංහ, සුරේඛා සමරසේන, කසුන් මහේන්ද්‍ර හීනටිගල, සඳුන් ප්‍රියංකර විතානගේ, හෂාන් විරංග බඹරබොටුව, ළහිරු කිතලගම, ආදීහු පෙන්වාදිය හැකි ය.

මේ නවක කවි කිවිඳියන්ගේ ඇතැම් කවි සයිබරයේ මෙන් ම පුවත් පත් මාධ්‍යයේ ද දැකිය හැකි බැවින් ඔවුන් සයිබර් කවියන් ලෙස ම හැඳිනවිය නොහැකි ය. නවක තරුණ කවි කිවිඳියන් නිර්භීත ලෙස කවිය වෙත එළැඹෙමින් සිටින අතර ඔවුන්ගේ ආත්ම විශ්වාසය පිළිබඳ ඇතැම් විචාරකයන් සුභවාදී අදහස් පළ කර ඇත

(අතුකෝරල 2016: පෙරවදන). රෝහණ පොතුලියද්ද, ටිම්රාන කීර්ති, නදුන් යසිත, සුහර්ෂණි ධර්මරත්න, ඉහරු ප්‍රසංග, සුමින්ද කිත්සිරි, ලක්ශානත් අතුකෝරළ වැනි කවීන් ෆේස්බුක් වෙත අඛණ්ඩව කවි ලියන ආකාරයක් දැකිය නොහැකි ය. ඔවුන් කවි ලිවීමෙන් යම් පුහුණුවක් ලබා සිටින්නන් බව පෙනෙන බැවින් ඔවුන් නතිර ම සයිබරයට කවි ලිවීම අංකුර කවීනට පිටිවහලකි. ප්‍රවීණ කවි කිවිඳියන් සයිබර් අවකාශය කවි කටයුතු උදෙසා භාවිත නොකරන ආකාරයක් දැකිය හැකි ය. එනමුත් ඔවුන් සයිබර් අවකාශයට කවි පළ කරන්නේ නම් ආධුනික කවීනට එයින යම් කිසි මාර්ගෝපදේශයක් ලැබිය හැකි ය. ලියනගේ අමරකීර්ති, බුද්ධදාස ගලප්පත්ති, නන්දන වීරසිංහ, රත්න ශ්‍රී විජේසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු, එරික් ඉලයප්පාරච්චි, කුමාර හෙට්ටි ආරච්චි වැනි කවීන් සයිබර් අවකාශය වඩාත් සමීප ව භාවිත කරන්නේ නම් ආධුනිකයනට ඔවුන් හා අදහස් හුවමාරු කරගත හැකි ය. තරුණ කවි කිවිඳියනට නිවැරැදි මාර්ගෝපදේශයක් ඉන් ලැබේ. සයිබර් කවියේ තවත් පැතිකඩක් ලෙස 'බ්ලොග් කවි' හැඳින්විය හැකි ය. බ්ලොග් අඩවි සමූහ (බූන්දි) හා ඒකල වශයෙන් දැකිය හැකි ය. බූන්දි වෙබ් අඩවියේ කවියට වැදගත් ස්ථානයක් හිමි වී ඇත. වාරණය නිසි පරිදි ක්‍රියාත්මක කර ව්‍යක්ත සහ ප්‍රමිතිගත ලෙස කවි පවත්වාගෙන යෑම එහි දී සිදු වේ. පෞද්ගලික බ්ලොග් අඩවි (බස්සිගේ නවාතැන, වැහි මන්දාරම, බඹර කවි, කිරි කවඩි, හිතනලනත්ය) ඔස්සේ ද සයිබරයට කවි මුදා හැරේ. හතිනලන්තය බ්ලොග් අඩවිය ආකෘතික වශයෙන කුඩා කවි (හයිකු කවි වැනි කවි) ඉදිරි පත් කරයි. මෙවන් නව ප්‍රවණතා ද සයිබර් කවියෙන් දැකිය හැකි වේ. වෝල්ටර් බෙනජ්මින්ගේ මතය අනවු (යානත්‍රික ප්‍රතිනිෂ්පාදන යුගයේ කලා කෘති) සයිබර් අවකාශය යන්‍ත්‍රානත්‍රික ප්‍රතිනිෂ්පාදන යුගයේ එක් අවධියකි. එසේ වුව ද කවියේ පැවැත්මට සයිබර් අවකාශය ස්ථිර නැත. මේ හේතුවෙන් සයිබර් කවියෝ සිය කවි එකතු ග්‍රන්ථ වශයෙන් එළි දක්වති. රුවන් බන්දුජීව, ඉනදීක ගුණවර්ධන, සෞම්‍ය සඳරුවන් ලියනගේ, විශ්වජිත් මනමේන්ද්‍ර, ධනඤ්ජා නිෂාදි කුලරත්න ආදීහු එලෙස ග්‍රන්ථ ප්‍රකාශ කළ කවිහු වෙති.

වර්තමානයේ ඇතැම් තරුණ තරුණියෝ විනෝදය සඳහා ම පමණක් කවි සයිබර් අවකාශයට මුදා හරිති. එවන් නිර්මාණ, කවි ලෙසට ම අර්ථකථනය කළ හැකි ද යන්න පිළිබඳ විවිධ විචාරක මත පවතී. මෑත කාලීන ව සාධනයී ලක්ෂණ පෙන්නුම් කරමින් සාර්ථක ලෙස ගොඩනැඟී ආ සයිබර් කවිය යළි පාඨකයාගේ රුචිකත්වයෙන ඈත් වෙමින් පවතින ආකාරයක් දැකිය හැකි ය. වර්තමානයේ ෆේස්බුක්හි පළ වන කවිවලට ඉදිරි පත් වන පාඨක ප්‍රතිචාර ගුණත්වයෙන් තොර ඒවා ය. ආධුනික කවියකුට අවශ්‍ය උපදේශ ඉන් නොලැබේ. එබැවින් නිවැරැදි, අර්ථාන්විත ප්‍රතිචාර ප්‍රාමාණික කවියකුගෙන් හෝ විචාරකයකුගෙන් ලැබෙන්නේ නම් ආධුනික කවීනට එය වඩා ප්‍රයෝජනවත් වේ. සයිබර් අවකාශයේ පළ වන ඇතැම් කවිවල කර්තෘ අඥාත ය. නැත හොත් කර්තෘ අන්වර්ථ නම් කිහිපයකින් පෙනී සිටියි. එබැවින් නිර්මාණකරුවාගේ අනන්‍යතාව පිළිබඳ ගැටලු පවතී. ඇතැම් තරුණ කවීන් කවි පළ කරන්නේ විනෝදාංශයක් වශයෙනි. ඇතැම් කවිහු දීර්ඝ කාලීන ව කවි ලියන්නනෝ ද නොවෙති. ඔවුනට කවිය පිළිබඳ ගැඹුරු කියවීමක් නැත. අන්තර්ජාලයේ කවීන්ගේ කවිවල සංස්කාරකවරයා ද තමා ම බවට පත් වන බවක් විද්‍යමාන වේ (සෙනෙවි 2011: 22). විමසීමක්, සංස්කරණ ක්‍රියාවලියක් හෝ වාරණයක් රහිත වීමක් සයිබර් අවකාශයී ප්‍රකාශනයේ දක්නට නොමැති බැවින කවියේ ගුණාත්මක බව පිළිබඳ දැඩි විවේචන එල්ල වෙමින පවතී. එබැවින් ඇතැම් විදග්ධ කවීන්ගේ හා විචාරකයන්ගේ අප්‍රසාදයට සයිබර් කවිය පත් ව ඇත.

## නිගමනය

සිංහල කවියේ නව මුහුණුවර සයිබර් කවිය ලෙස හඳුනාගත හැකි ය. අනුරාධපුර යුගයේ සිට (ක්‍රි. ව. 5) ආරම්භ වී නූතන යුගය දක්වා ඉතා පුළුල් ලෙස සිංහල කවිය ගමන් කර ඇති බව පෙනේ. ඒ විකාශනයේ තත්කාලීන අවධිය සයිබර් කවිය ලෙස හඳුනාගත හැකි ය. පරිගණක තාක්ෂණයේ දියුණුවත් සමඟ සයිබර් අවකාශයී ප්‍රකාශන මාධ්‍ය නව තරුණ කවි කිවිඳියන්ගේ ප්‍රධාන ප්‍රකාශන මාධ්‍යය බවට පත් ව ඇත. ඒ ඔස්සේ ප්‍රකට අප්‍රකට කවි කිවිඳියෝ සයිබර් අවකාශයී ප්‍රකාශන මාධ්‍යය ඔස්සේ බිහි වෙති. එසේ බිහි වන කවි විදග්ධ කාව්‍ය සම්ප්‍රදායයකට මුල පුරන බව විද්‍යමාන කරුණකි.

## ආශ්‍රිත ගන්ත්‍ර

ගලප්පත්ති, බුද්ධදාස. (2014 ජනවාරි)"මුහුණු පොත් කවිය", මීඩියා ටුඩේ, බත්තරමුල්ල: ක්‍රියේටිව් මීඩියා කෝපරේෂන්.

හිනිදුම, සෙනෙවි සුනිල්. (2014ඃ ජුලි-සැප්ඃ 3 කලාපයඃ 3 වෙළුම) "සයිබර් අවකාශයේ අපේ කවිය" ප්‍රලේඛා, කොළඹ 7ඃ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

හිනිදුම, සෙනෙවි සුනිල්. (2011) නූතන ම සිංහල කවිය පිළිබඳ නිරීක්ෂණ කිහිපයක්, බූන්දි ප්‍රකාශන. ලංකාර (04 කලාපය), (සංස්) ලියනගේ කුමාර, කලන කන්ටෙන්ට් පබ්ලිෂිං.

අතුකෝරල, සුපුන්. (2016) ප්‍රේමයට ඉඩක් ඇත, කොළඹ 10ඃ සුරස ප්‍රකාශන.

ගුණවර්ධන, ඉන්දික. (2010) හිතේ කෙටූ ටැටූ

අමරකීර්ති, ලියනගේ. (2010) කවියෙහි රැඩිකල් විභවතාව විදාරණය කිරීම හෙවත් තරුණ කවියෙහි ප්‍රතිසංස්කෘතිකවත් බව සමාජගත කිරීම, අකුරු ඔබ දෙස බලා සිටී, වෙනස් වෙමු කවය, කොළඹඃ වෙනස් වෙමු ප්‍රකාශන.

චන්ද්‍රසේකර ආ. දො. (සංස්)1983, 1982 නවකවි, කොළඹඃ සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

අමරකීර්ති, ලියනගේ . (2009), "අන්තර්ජාතික ප්‍රගතිශීලීන්ගේ නව මානව සම්බන්ධතා", උපුල් සේනාධීරගේ, සියොතුනට එනු පිණිස, ඉදදබාස පොතක්.

Benjamin, Waiter. (2007), Illuminations, Schocken Books, New York